Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සබරගමුව-සතිපාසල

විශය : නාට්‍ය හා රංගකලාව

සතිය : 07

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය

සකස් කිරීම : මාවනැල්ල කලාපය

# සත්ව චර්යාවන් අනුකරණය කරමින් ක්ෂණික නිරූපණයෙහි යෙදෙමු.

සත්ව චර්යා අනුකරණය කරමින් ක්ෂණික නිරූපණයේ යෙදීමට ඔබ විවිධ කරුණු පිළිබඳ අවබෝධ කරගත යුතුය. එනම්,




- සත්ව චරිත වල විශේෂ ලක්ෂණ හා ඉරියවු හඳුනාගැනීම.
- එම චරිතයන් හී ඇති විවිධත්වය පිළිබඳ හඳුනාගැනීම.
- චරිතයේ ආකාරයට අනුකරණය කිරීමට හැකි වීම.
- සතුන්ගේ හඬ අනුකරණය කිරීමට හැකිවීම.
- සාමූහිකව ක්‍රියා කිරීමේ හැකියාව වර්ධනය වීම.

සත්ව චර්යා අනුකරණය කරමින් රංගනයේ යෙදීමේදී රංගන ශිල්පියා මුලින්ම කළ යුතු වන්නේ විවිධ සත්ව චර්යා හොඳින් නිරීක්ෂණය කිරීමයි. මිනිස් ලෝකයේ මෙන්ම සත්ව ලොව තුළ ද එක් එක් සත්වයාට වෙන් වෙන් වූ ආවේණික චලනයන් පවතී. රංගනයේදී ඒවායේ විවිධත්වය හා රිද්මයන් අවබෝධ කරගත යුතුය.

උදා :

- අලියෙකු හා ඉබ්බෙකුගේ ශාරීරික චලන එකිනෙකට වෙනස්ය.
- මී මැස්සාගේ චලනය කඩිසර බවින් වැඩිය.
- බල්ලාගේ හා බළලකුගේ චලනයන් වෙනස්ය.

චලන හා රිද්මයන්ට අමතරව ඔවුන්ගේ ශබ්දයන් ද නාට්‍ය සඳහා නිර්මාණාත්මකව යොදාගත හැකිය.නාට්‍ය නිර්මාණයේ දී සත්ව චරිත භාවිත කර සමාජයට හොඳ පනිවිඩයක් ලබාදිය හැකිය. ඒ සඳහා සත්ව චර්යා හොඳින් නිරීක්ෂණය කර ලබාගත් අත්දැකීම් රංගන ශිල්පියා තුළ තිබිය යුතුය.

නාට්‍ය යනු සාමූහික ක්‍රියාවලියකි. මෙවැනි සත්ව චරිත අනුකරණයේ දී ද සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වේ.පහත දැක්වෙන්නේ වේදිකා නට්‍ය කිහිපයක සත්ව චරිත නිරූපණය කර ඇති ආකාර වේ. එහි ඇති විවිධ සත්ව වර්ග වල චර්යාවන් අනුකරණය කිරීම සාර්ථකව සිදුව ඇත.





ඉහත ඡායාරූප නිරික්ෂණය කිරීමේ දී නිර්මාණාත්මකව සත්ව චරිත අනුකරණය කළ හැකි බව මනාව පසක් වේ.





පැවරුම්;

- සත්ව චර්යා නිරූපිත වේදිකා නාට්‍ය නරඹන්න.

  උදා: නරිබෑනා, පුංචි අපට දැන් තේරෙයි, දගයා

- සත්ව චර්යා නිරීක්ෂණය කර එම සිද්ධි නිර්මාණාත්මකව අනුකරණය කරන්න.